# කාර්ය සාධන වාර්තාව

# 2018

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

# අන්තර්ගතය


- අන්තර්ගතය 01
- ස්තූතිය 02
- මෙහෙවර 03

01.අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය 04

02.ආයතනයේ සංවිධාන ව්‍යුහය 06

03.දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරී ලේඛනය 07

04.පාලන අංශයේ කාර්යසාධනය 08

05.කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 13

06.ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 17

07.ඉංජිනේරු අංශයේ කාර්යසාධනය 26

08.වාස්තු විද්‍යා අංශයේ කාර්යසාධනය 30

09.ගිණුම් අංශයේ කාර්යසාධනය 34

10.අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය 37

## ස්තූතිය

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය කරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා 2018 වර්ෂයේදී ඇප කැප වී කටයුතු කළ මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලයට පළමුව කෘතඥතාවය පළ කරමි.

තවද, මෙම දෙපාර්තමේන්තුවේ සේවයන් නිසි පරිදි සැලසීමට නිසි මග පෙන්වීම් ලබා දෙමින් මෙම දෙපාර්තමේන්තුව වෙත දැක්වූ කාරුණික සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම්, ළමා හා කාන්තා අමාත්‍යාංශයේ සහ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ අදාළ සියළු නිලධාරීන්ටත්, සමස්ථ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පිරිනමමි. එමෙන්ම දෙපාර්තමේන්තුවේ සැලසුම් කටයුතුවලදී සහයෝගය ලබාදුන් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන්, සභාපතිවරුන් කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් දැක්වූ කාරුණික සහයෝගය හා රාජකාරී කැපවීම සඳහා කෘතවේදීතාවය පළ කරමි.

අවසාන වශයෙන් 2018 වසරේ අප දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී නන් අයුරින් සහයෝගය දැක්වූ සියළුම රාජ්‍ය ආයතනවලටත්, අනෙකුත් අදාළ ආයතන හා පුද්ගලයන්ටත් ස්තූතිය පුද කරමි.

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

# දැක්ම

"සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු"

## මෙහෙවර

" ජාතික භෞතික ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම"

## 01. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී අගනුවර වූ කොළඹ පිහිටි ජනාවාස ආශ්‍රිතව ඉදිකිරීම් සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළු නිරාකරණය අරමුණු කරගෙන 1915 අංක 19 දරණ නිවාස හා නගර වැඩි දියුණු කිරීමේ ආඥා පනත බලාත්මක විය. නමුත් වරාය හා දුම්රිය ආශ්‍රයෙන් ඇතිවූ නගරවල සංවර්ධනය සම්බන්ධයෙන් උක්ත පනතින් ආවරණය නොවූ ගැටළු ඇතිවිය. ඊට පිළියමක් ලෙස 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. මේ යටතේ දිවයිනේ සියළු පළාත් ආයතන සම්බන්ධ කර ගනිමින් ජනාවාස සංවර්ධනය සඳහා සැලසුම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ විය.

නිසි සැලැස්මක් හා ඉදිරි දැක්මක් නොමැතිව රට තුළ ඇතිවූ සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස දුගී භාවය සම්පත් බෙදී යාමේ විෂමතාවය නිසා ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි සංවර්ධනයක් සිදු නොවීම, පරිපාලනය කොළඹ හා ප්‍රධාන නගර කීපයකට කේන්ද්‍රගත වීම, ජීවත්වීමට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිව විරැකියාවෙන් පෙළෙන සහනාධාර මතම ජීවත්වන බහුතර ජනතාවක් ව්‍යාප්ත වීම ආදී ගැටළු රාශියක් පැන නැගිනි. එබැවින් ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසාර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය දැඩි ලෙස දැනුනි.

ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කරනු ලැබීම පිණිස 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින්, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය කර, 2000 වර්ෂයේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි.

> “ ජාතික භෞතික ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම“ මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

ඒ අනුව ජාතික භෞතික සැලැස්ම, කලාපීය භෞතික සැලසුම් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීමත්, පූජා භූමි සංවර්ධනය උදෙසා ව්‍යාපෘති සැලසුම් කිරීම හා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් සමග ඒ සඳහා වින්‍යාස සැලසුම් සැකසීමත් අතින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට වසර හැත්තෑවකට ආසන්න සේවා ඉතිහාසයක් ඇත.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් නවයෙහිම පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් සූක්ෂම ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු

නගර ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම ආදී කර්තව්‍යන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අති මහත්ය.

මෙම කර්තව්‍යන් ඉටු වන්නේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන ජාතික භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, කලාපීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශවල සාමූහික කැපවීමෙනි. මෙම එක් එක් අංශවල 2018 වසරේ කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එක් එක් පරිච්ඡේද යටතේ දක්වා ඇත.

භෞතික සැලසුම්කරණය තුලින් ශ්‍රී ලංකාවේ දැනට පවතින කලාපීය අසමතුලිතතාවය දුරුකර සුසැදි සුරැකි සොඳුරු භෞතික පරිසරයක් නිර්මාණය කිරීමට මෙම දෙපාර්තමේන්තුව සැරසී සිටි බව දන්වා සිටීමට කැමැත්තෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

## 2. සංවිධාන සටහන

**3.2**018/01/01 දින සිට 2018/12/31 දින දක්වා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරී ලේඛණය.

1. අධ්‍යක්ෂ ජනරාල් - ආචාර්ය ජගත් මුණසිංහ මහතා

2. අධ්‍යක්ෂ (පාලන) - ආර්.එම්.එච්.බී. රත්නායක මහතා -2018.03.26 සිට 2018.10.18 දක්වා

3. අධ්‍යක්ෂ (පාලන) - එන්.ඒ.ඒ.එස්. නිශ්ශංකආරච්චි මහතා -2018.10.22 දින සිට

4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආර්.ටී.බී.ඒ.ඒ. රත්නායක මයා

5. අධ්‍යක්ෂ (ඉංජිනේරු)- සී. කුලරත්න මහතා

6. අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) - එච්.ඩී.සී.පී. හෙට්ටිආරච්චි මිය

7. ප්‍රධාන ගණකාධිකාරී - එල්.පී. චිත්‍රරංජන් මහතා

8. සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) - කේ. සුමනදාස මහතා

09.සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) - ච.ච.කු. බණ්ඩාරනායක මයා

10.සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු- ඊ.ආර්.එස්. සමරසිංහ මහතා

11. නීති නිලධාරී - ඩබ්.එච්.එස්. පෙරේරා මිය

12. සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) - ඒ. ප්‍රියානි මිය

## 04. පාලන අංශයේ කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායීවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

එහි දී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදු කිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමත්, පූජා භූමි කාර්ය මණ්ඩලයේ පාලනය පවත්වාගෙන යාමත් පාලන අංශයෙන් සිදු කරයි.

පාලන අංශය 2018.01.01 දින සිට 2018.03.26 දින දක්වා අධ්‍යක්ෂ (ඉංජිනේරු)/අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලැබූ අතර, 2018.03.26 දින සිට 2018.12.31 දින දක්වා අධ්‍යක්ෂ (පාලන) ගේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. .

### 4.1 පාලන අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ,

- දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟාකර ගත හැකි වන පරිදි සංශෝධනය කිරීම,
- බඳවා ගැනීමේ පරිපාටි, උසස් කිරීමේ පරිපාටි සැකසීම, අනුමත කරවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම,
- කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය, සුභසාධනය, විනය පවත්වා ගැනීම ආදියයි.

### 4.2 දෛනික රාජකාරි ලෙස,

- දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීමත්
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාමත්
- මහජන ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීමත්
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමත්
- කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපිගොනු නඩත්තුව, පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීමත්
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීමත්
- සේවක වැටුප්, දීමනා, ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාළ කටයුතුත් ය.

එසේම

- ❖ පාර්ලිමේන්තු ප්‍රශ්නවලට, මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිවලට, මහජන පෙත්සම් කාරක සභාවේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- ❖ දෙපාර්තමේන්තුවේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීම.
- ❖ නඩත්තු කටයුතු පිළිබඳව කටයුතු කිරීම.
- ❖ කැබිනට් මණ්ඩල පත්‍රිකා සැකසීම.
- ❖ පූජා භූමි කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම, පාලන අංශයට පැවරුණු වෙනත් විශේෂ රාජකාරි වේ.

2018.12.31 වන විට මෙම දෙපාර්තමේන්තුවේ පූජා භූමි කාර්ය මණ්ඩලය ඇතුලු සමස්ථ කාර්ය මණ්ඩලය 367 ක් වූ අතර, ඒ අතුරින් තනතුර දරන්නාට පෞද්ගලික වන සේ පවතින පූජා භූමි කාර්ය මණ්ඩලය 85 කි.

### 4.3 2018.12.31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව පිළිබද තොරතුරු

| අනු අංකය | නිලධර ගණය | තනතුරු නාමය | තනතුරට අයත් සේවය | වැටුප් කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ විධායක | අධ්‍යක්ෂ ජනරාල් | දෙපාර්තමේන්තුගත | SL 3/2016 විශේෂ | 1 |
| 2 | ජ්‍යෙෂ්ඨ විධායක | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ක්‍රියාත්මක කිරීම 01 සැලසුම් 01 | දෙපාර්තමේන්තුගත | SL 3/2016 විශේෂ | 2 |
| 3 | විධායක | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය -1 | SL 1/2016 | 1 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | SL 1/2016 | 1 |
| 5 | විධායක | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය -1 | SL 1/2016 | 1 |
| 6 | විධායක | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය -1 | SL 1/2016 | 1 |
| 7 | විධායක | අධ්‍යක්ෂ | දෙපාර්තමේන්තුගත | SL 1/2016 - 1 ශ්‍රේණිය | 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | විධායක | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය -1 | SL 1/2016 | 1 |
| 9 | විධායක | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය -11 / 111 | SL 1/2016 | 1 |
| 11 | විධායක | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය -11/111 | SL 1/2016 | 1 |
| 12 | විධායක | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය -11/111 | SL 1/2016 | 3 |
| 13 | විධායක | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය - 11/111 | SL 1/2016 | 3 |
| 14 | විධායක | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (නගර හා නිර්මාණ) | දෙපාර්තමේන්තුගත | SL 1/2016 (111,11 ශ්‍රේණි) | 30 |
| 15 | විධායක | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | SL 1/2016 (111,11 ශ්‍රේණි) | 1 |
| 16 | තෘතීයික | පරිපාලන නිලධාරි | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය අධි ශ්‍රේණිය | MN 7/2016 A | 1 |
| 17 | තෘතීයික | ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය - විශේෂ | MN 7/2016 A | 1 |
| 18 | තෘතීයික | ප්‍රධාන පරීක්ෂක (විශේෂ පන්තිය) | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය - විශේෂ | MN 7/2016 A | 2 |
| 19 | තෘතීයික | සැලසුම් කාර්යාල සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය - විශේෂ | MN 7/2016 A | 3 |
| 20 | තෘතීයික | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | MN 6/2016 A II/I | 1 |
| 21 | ද්විතීයික | සංවර්ධන සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4/2016 A | 2 |
| 22 | ද්විතීයික | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරී සේවය-111/11/ 1 | MN 4/2016 A | 20 |
| 23 | ද්විතීයික | භෞතික සැලසුම් සහකාර (නගර හා නිර්මාණ) | දෙපාර්තමේන්තුගත | MN 4/2016 A | 14 |
| 24 | ද්විතීයික | භෞතික සැලසුම් සහකාර (වාස්තුවිද්‍යා) | දෙපාර්තමේන්තුගත | MN 4/2016 A | 1 |
| 25 | ද්විතීයික | සැලසුම් ශිල්පී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය -111/11/1 | MN 3/2016 A | 21 |
| 26 | ද්විතීයික | පරීක්ෂක/කාර්මික නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය -111/11/1 | MN 3/2016 A | 9 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 27 | ද්විතියික | ප්‍රමාණ සමීක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය -111/11/1 | MN 3/2016 A | 7 |
| 28 | ද්විතියික | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය 111/11/1 | MN 2/2016 A | 34 |
| 29 | ද්විතියික | භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණික ශිල්පී | දෙපාර්තමේන්තුගත | MT 2/2016 A | 6 |
| 30 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත -111/11/1 | MN 1/2016 A - | 1 |
| 31 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | සැලසුම් මුද්‍රණකරු | දෙපාර්තමේන්තුගත -111/11/1/විශේෂ | PL 1/2016 A | 2 |
| 32 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | මැණුම් සහයක | දෙපාර්තමේන්තුගත -111/11/1/විශේෂ | PL 1/2016 A | 3 |
| 33 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | සැලසුම් භාරකරු | දෙපාර්තමේන්තුගත -111/11/1/විශේෂ | PL 1/2016 A | 1 |
| 34 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | සැලසුම් අළුත්වැඩියාකරු | දෙපාර්තමේන්තුගත -111/11/1 | PL 1/2016 A | 1 |
| 35 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය 111/11/1/විශේෂ | PL 3/2016 A | 14 |
| 36 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය 111/11/1/විශේෂ | PL 1/2016 A | 17 |
| 37 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | බංගලා භාරකරු | දෙපාර්තමේන්තුගත -111/11/1/විශේෂ | PL 1/2016 A | 4 |
| 38 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | මුරකරු | දෙපාර්තමේන්තුගත -111/11/1/විශේෂ | PL 1/2016 A | 4 |
| 39 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | ඕවර්සියර්/වැඩ පරීක්ෂක | දෙපාර්තමේන්තුගත | PL3-2016A | 5 |
| 40 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | කම්කරු | දෙපාර්තමේන්තුගත | PL1-2016A | 40 |
| 41 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | මුරකරු | දෙපාර්තමේන්තුගත | PL 1/2016 A | 4 |
| 42 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | සංචාරක බංගලා සහායක | දෙපාර්තමේන්තුගත | PL1-2016A | 5 |
| 43 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | උද්‍යාන කම්කරු | දෙපාර්තමේන්තුගත | PL1-2016A | 3 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 43 | ප්‍රාථමික (ශිල්පීය නොවන) | සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තුගත | PL1-2016A | 5 |
| | | | | **එකතුව** | **282** |

මීට අමතරව එම තනතුරට පමණක් අනුමත පූජා භූමි කාර්ය මණ්ඩලය .

| | | | | | |
|---|---|---|---|---|---|
| **44** | ප්‍රාථමික(ශිල්පීය නොවන) | ඕවර්සියර් (වැඩ පරීක්ෂක) | **දෙපාර්තමේන්තුගත** | MT2-2006A | **2** |
| **45** | ප්‍රාථමික(ශිල්පීය නොවන) | ඕවර්සියර් (වැඩ පරීක්ෂක) | දෙපාර්තමේන්තුගත | PL 1-2006 A | **7** |
| **46** | ප්‍රාථමික(ශිල්පීය නොවන) | මුරකරු | දෙපාර්තමේන්තුගත | PL 1-2006 A | **10** |
| **47** | ප්‍රාථමික(ශිල්පීය නොවන) | කම්කරු | දෙපාර්තමේන්තුගත | PL 1-2006 A | **66** |
| එකතුව | | | | | **367** |

**මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍රය**

### 4.4 2018 වසරේ දී සිදු කරන ලද නීති කටයුතු

- දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත ගිවිසුම් සකස් කිරීමට දායක වීම.
- පූජා භූමි සම්බන්ධිත ගැටළු වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී අදාළ ගැටළු නිරාකරණයට පියවර ගැනීම
- දෙපාර්තමේන්තුවේ නිශ්චල දේපළවලට (ස්ථාවර වත්කම්) අදාළ තක්සේරු වාර්තා, හිමිකම් සහතික සහ පිඹුරු/සැලැස්ම ලබා ගැනීමට පියවර ගැනීම
- දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරී වශයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ බාහිර පුරවැසියන් වෙනුවෙන් තොරතුරු ලබා දීමට කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවට අදාළ 1946 නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය සඳහා පියවර ගැනීම.
- දෙපාර්තමේන්තුවේ ගැටළු වෙනුවෙන් විමර්ශන කටයුතු සිදු කිරීමට දායක වීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් පවත්නා නඩු කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන සමග නෛතික කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කිරීම.
- නීතිමය ගැටළු සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම

## 05.කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්ය සාධනය

### 5.1 අරමුණ


මෙම අංශයේ ප්‍රධානතම කාර්යය වන ජාතික භෞතික සැලැස්ම, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කළාපීය භෞතික සැලසුම් සකස් කිරීම මෙම අංශයට අයත් කාර්යභාරය වේ.

### 5.2 කාර්ය මණ්ඩලය

2017 වසරේදී මෙම අංශයේ අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවති අතර එම තනතුරේ වැඩ බලන ලද්දේද ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ විසිනි. භෞතික සැලසුම් සහකාරවරුන් 09 දෙනෙකු විසින් මෙම අංශයේ කාර්යභාරය ඉටු කරන ලදී.

### 5.3 ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය සකස් කිරීම

රට තුළ හා ඉන් බාහිරව ඇති භෞතික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන ජාත්‍යන්තර වශයෙන් ඇතිවී ඇති ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලී ලෙස උපයෝගී කර ගැනීමත් භෞතික සංවර්ධන ක්‍රියාවලිය ජාතික හා ජාත්‍යන්තර ලෙස සම්බන්ධීකරණය කිරීමත් පවතින සමාජ ආර්ථික හා භෞතික විෂමතා අවම කර ගැනීමටත්, ස්වභාවික පරිසර ජාලය සහ පාරිසරික අධි සංවේදී ප්‍රදේශ රැක ගනිමින් ද, වර්ධනය කර ගනිමින් ද ස්වභාවික විපත් අවම වන අන්දමට සුදුසු ස්ථානයන්හි ජනාවාස, නගර හා අපර ව්‍යුහ පහසුකම් හා වනාන්තර ඇතුලත් පාරිසරික පද්ධතියක් ස්ථාපිත කිරීමටත් ජාතික ආර්ථිකයේ ප්‍රතිලාභ දෙගුණ තෙගුණ කිරීමටත් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම වැදගත් වේ.




**රූප සටහන 02: ජාතික භෞතික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය**

**මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර**

## 5.4 2018 වර්ෂයට අදාළව කලාපීය භෞතික සැලසුම් අංශය විසින් කරන ලද කාර්යයන්

- ✓ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම - 2050 යාවත්කාලීන කිරීම
- ✓ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ගැසට් පත්‍රිකාව සකස් කිරීම.
- ✓ යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම මුද්‍රණ කටයුතු සඳහා සකස් කිරීම
- ✓ විවිධ ආයතනවල පැවැත්වෙන ජාතික හා කලාපීය රැස්වීම් හා වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි වීම.
- ✓ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ ජාතික භෞතික සැලසුම් නිර්මාණ සභාව, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව හා තාක්ෂණික උපදේශක කමිටුව යනාදියෙහි සම්බන්ධීකරණ කටයුතු
- ✓ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ කටයුතු සඳහා සහභාගි වීම.
- ✓ ජාතික හා කලාපීය ව්‍යාපෘති සම්බන්ධ මධ්‍යම පරිසර අධිකාරියේ පවත්වන ලද පරිසර ඇගයුම් වාර්තා හා අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගිවීම.

## 5.5 කලාපීය සැලසුම් සකස් කිරීම


රටට වඩා කුඩා වූ ද, නගරයකට වඩා විශාල වූ ද ප්‍රදේශයක් සඳහා සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. අපගේ අවශ්‍යතාවය සඳහා ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකාවේ පළාත්, කලාප වශයෙන් හඳුන්වා ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

### 5.5.1 කලාපීය සැලැස්ම සකස් කිරීම

- කලාපීය සැලැස්ම සකස් කරන්නේ කලාපීය සැලසුම් කමිටුව විසින්ය.
- මෙම කමිටුවේ සභාපති වන්නේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ය.
- පළාතේ සියළුම නගර සභා/ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් ද මහ නගර සභාවල නාගරික කොමසාරිස්වරුන් ද මෙම කමිටුවේ සාමාජිකයෝ වෙති.
- සමහර රජයේ ආයතනවල නිලධාරීන් ද මෙම කමිටුවට ඇතුලත් වෙති.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විශේෂයෙන් ස්ථාපිත කර ඇත්තේ කලාපීය සැලසුම් සකස් කිරීම පිණිස පළාත් සභාවලට සහය වීමටයි. ඒ සඳහා පහත දැක්වෙන අයුරින් මෙම දෙපාර්තමේන්තුව පළාත් සභාවලට සහාය වේ.

- තාක්ෂණික උපදෙස් ලබාදීම
- අවශ්‍ය ඕනෑම කරුණක් පිළිබඳව කලාපීය සැලසුම් කමිටුවට අවශ්‍ය විශේෂඥයින්ගේ සේවය ලබා දීම.
- රැස්වීම්, ඉදිරිපත් කිරීම් හා මහජන අදහස් ලබා ගැනීම පිණිස සහාය වීම.
- අවශ්‍ය තොරතුරු හා සැලසුම් ඕනෑම ආයතනයකින් ලබා ගැනීමට සහාය වීම.
- සැලසුම්, වාර්තා ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල්වල හිඟයක් වෙතොත් ඒවා ලබා ගැනීමට සහය වීම.




රූප සටහන 03 : කලාපීය සැලසුම් කමිටුව

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

**5.6 2018 වසරේ දී කරන ලද කාර්යයන්**

කලාපීය භෞතික සැලසුම් පවතින ජාතික භෞතික සැලැස්ම හා එහි ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය. 2018 වර්ෂයේ දී එතෙක් පැවති ජාතික භෞතික සැලැස්ම හා ප්‍රතිපත්තිය යාවත්කාලීන කරමින් පැවති බැවින්, කලාපීය සංවර්ධන සැලසුම් සම්පාදනය නොවිණි.

# 6. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය

## 6.1 කාර්යභාරය

ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය මගින් සිදුකරනුයේ කලාපීය භෞතික සැලසුම් මගින් හඳුනාගන්නා ලද ප්‍රාදේශීය වශයෙන් වැදගත් නගර සඳහා සැලසුම් පිළියෙල කිරීමට පළාත් පාලන ආයතනවලට සහය වීම සහ පූජා භූමි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම වේ .

## 6.2 කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ (ප්‍රාදේශීය භෞතික සැලසුම්) සෘජු අධීක්ෂණය යටතේ සංවර්ධන සහකාරවරු 12ක්, සංවර්ධන නිලධාරීන් 03 දෙනෙක් සහ භෞතික සැලසුම් සහකාරවරු 04 දෙනෙක්, කාර්යාල කාර්ය සහායකවරු දෙදෙනෙක් මෙම අංශයේ සේවයේ යෙදී සිටී.

## 6.3 ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යභාරය

- කුඩා නගර සංවර්ධන සැලසුම් සැකසීම.
- පුරනැගුම වැනි ව්‍යාපෘති හරහා ඒවා ක්‍රියාත්මක කරවීම.
- ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ සඳහා ජනාවාස සැලසුම් සැකසීම.
- හඳුනාගත් පූජා භූමි නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- පූජා භූමි සඳහා සංවර්ධන සැලසුම් සැකසීම.
- අනුරාධපුර, කතරගම, මහියංගන, මුතියංගන, මහනුවර, කැළණිය, අළු විහාරය යන පූජා භූමිවල අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විවිධ ආයතන විසින් කරනු ලබන විවිධ ඉඩම් භාවිතයන් සඳහා වන නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම.
- අමාත්‍යාංශය මගින් විවිධ අවස්ථාවලදී අප වෙත පවරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම

## 6.4 කුඩා නගර සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

- ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් බහුතරයකට (70%) මූලික නාගරික පහසුකම් ලබා කර දීම.
- තදාසන්න ප්‍රදේශයන්හි ආයෝජනය ග්‍රාමීය ප්‍රදේශයන්ට විතැන් කිරීම.
- අවිධිමත් නාගරීකරණයට පෙලඹෙන ජනයාට සිය ගම් බිම් ආශ්‍රිතව ක්‍රමවත් නාගරික කලාප බිහිකර දීම.
- සුපිරි මහනගරය සම්බන්ධිත සපිරි ග්‍රාම නගර පද්ධතියක් ඇති කිරීම.
- සමාජ, සංස්කෘතික, ආර්ථික, පුරාවිද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත් ග්‍රාම නගර පද්ධතියක් ජනතාවට දායාද කිරීම.
- විසල් නගරයක ඇති සියළු යටිතල පහසුකම් සහිත සපිරි ග්‍රාම පුරවර බිහිකිරීමට අවශ්‍ය පදනම යෙදීම.

**6.5 2018 වසරේදී කරන ලද කාර්යයන්**

**6.5.1 මහියංගනය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය**

1. මහියංගනය සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම රු. මි. 0.435
2. විදුලි පද්ධතිය නවීකරණය සඳහා සැලසුම් සකස් කිරීම
3. ධාතු මන්දිරය නවීකරණය සඳහා සැලසුම් සකස් කිරීම
4. උඩ මළුව වටා වලාකුළු බැම්ම නවීකරණය සඳහා සැලසුම් සකස් කිරීම.
5. මහියංගන පූජා භූමි ප්‍රදේශ භූ දර්ශන සැලැස්ම සකස් කිරීම.

**6.5.2 අනුරාධපුර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමය තුළ 2018 වසර තුළ සිදු කරන ලද කටයුතු**

1. පහත සඳහන් ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සහ සංචාරක අමාත්‍යාංශය සමග සංවර්ධන කටයුතු සිදු කිරීම.
   ඉසුරුමුණිය රජමහා විහාරය අසල
   රුවන්වැලිසෑය අසල
   සමාධි පිළිමය අසල
2. මහා විහාරය ඉදිරිපිට භූ දර්ශනය කිරීම
3. පූජා භූමි සංවර්ධන කමිටුව සංවිධානය කිරීම
4. අනුරාධපුර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමය තුළ සිදු කරන අනවසර ඉදිකිරීම් දිනපතා පරීක්ෂා කර ඒ සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කිරීම
5. ලෝවාමහාපාය පොහොය ගෙය සංවර්ධනය කිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම සම්බන්ධීකරණය සිදු කිරිම.
6. රුවන්වැලිසෑය සංවර්ධනය කිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම සම්බන්ධීකරණය සිදු කිරිම
7. අනුරාධපුර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමයේ පැවතුනු සීමා මායිම් පුළුල් කිරීම සහ එය ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම
8. අනුරාධපුර පූජා භූමියේ ඇතුල්නුවර ප්‍රදේශයේ පුරාවිද්‍යා කැණීම් සිදු කිරීම සඳහා එහි පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමට ලෝලුගස්වැව නව නගරය ඉදිකිරීමට බලාපොරොත්තු අතර, ඒ සඳහා අදාළ භූමිය නිදහස් කර ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය කටයුතු සිදු කිරීම.

**6.5.3 මහනුවර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය**

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ජාතික භෞතික සැලසුම් ව්‍යාපෘති කාර්යාලය නවීකරණය කිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම සම්බන්ධීකරණය.

**6.5.4 මාතලේ අලුවිහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය**

අලුවිහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය යටතේ පූජා භූමියට පවරාගත් ඉඩම්වල මැනුම් කටයුතු සිදු කිරීම

6.5.5 මෙත්සිත් අරණ ව්‍යාපෘතිය (කොළඹ දිස්ත්‍රික්කය)

1. මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ සිදු කරන හෝමාගම, ඉඹුලකන්ද, සම්බුද්ධි විහාරයේ ධම්ම මණ්ඩපය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම.
2. බොරැල්ල ගෝතමී විහාරය සඳහා යෝජිත බහු කාර්ය ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම.
3. මොරටුව, සොයිසාරාමය විහාරස්ථානය සඳහා යෝජිත බහුකාර්ය ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම.
4. කෝට්ටෙ රජමහා විහාරස්ථානය සඳහා යෝජිත මහල් 04 කින් යුක්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ හා මහල් 06 කින් සහ තෙටයකින් සමන්විත බහුකාර්ය ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
5. මඩු මාතාවන්ගේ දේවස්ථානය පූජා භූමියක් ලෙස ගැසට් කිරීමේ කටයුතු.
6. මඩු මාතාවන්ගේ දේවස්ථානය සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීම.

6.5.6 පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. දිඹුලාගල පූජා භූමිය සඳහා වාහල්කඩ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අදාළ රාජකාරි කටයුතු ඉටුකිරීම.
2. දිඹුලාගල පූජා භූමිය සඳහා දෙමහල් පිරිවෙන් හා සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අදාළ රාජකාරි කටයුතු ඉටුකිරීම.

1. පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතියේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ව්‍යාපෘති 15 ක් සඳහා අදාළ රාජකාරි ඉටුකිරීම.
2. පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතියේ පාසල් 08 ක් සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීමට අදාළ රාජකාරි කටයුතු ඉටුකිරීම.
3. පුලතිසි නිකේතනයට අදාළ සියළු රාජකාරි කටයුතු ඉටුකිරීම.
4. මින්නේරිය මහසෙන් රජමහා විහාරය පූජා භූමියක් වශයෙන් ගැසට් කිරීම සඳහා අදාළ රාජකාරි ඉටුකිරීම.

6.5.7 කැලණිය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

1. කැලණිය රජමහා විහාරයේ පැවැත්වෙන වාර්ෂික දුරුතු මහා පෙරහැර පැවැත්වීම හා සම්බන්ධ රැස්වීම් සඳහා සහභාගි වීම හා ඊට අදාළ කටයුතු ඉටුකිරීම.
2. කැලණිය රජමහා විහාරයේ දෛනික නඩත්තු කටයුතු ඉටුකිරීම සම්බන්ධීකරණය
3. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා එක්ව කැලණිය රජමහා විහාරයේ කසළ කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කිරීම.
4. ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්, දිස්ත්‍රික්කයේ පාරිසරික, ආර්ථික, සමාජීය හා සැලසුම් කටයුතු සම්බන්ධ රැස්වීම් හා රාජකාරි සඳහා සහභාගිවීම.
5. සෝමාවතී විහාරය පූජා භූමියක් වශයෙන් ගැසට් කිරීම සඳහා අදාළ රාජකාරි

මාතර දිස්ත්‍රික්කය

1. මහා මන්තින්ද විහාරය සඳහා වින්‍යාස සැලැස්ම සකස් කිරීම
2. කොළමෙණිගම රජමහා විහාරස්ථානය පූජා භූමියක් ලෙස ගැසට් කිරීම සඳහා වාර්තා සකස් කර බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත යැවීම
3. දෙවිනුවර පරම විචිත්‍රාරාම විහාරස්ථාන පූජා භූමි කමිටු රැස්වීම් රැස් කිරීම.

6.5.8 ගම්පහ දිස්ත්‍රික්කය

- මෙත්සිත් අරණ ව්‍යාපෘතිය

1. මාබිම සීවලී ආරණ්‍ය (තායි ශ්‍රී ලංකා බෞද්ධ මධ්‍යස්ථානය) ඉදිකෙරෙන භාවනා කුටි පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ, රැස්වීම් හා සැලසුම් සකස් කිරීමේ කටයුතු ඉටුකිරීම

- සුබිත පුරවර ව්‍යාපෘතිය

1. මීවිටිගම්මන ශ්‍රී නාලිකේරාමය පුරාණ විහාරයේ ඉදිකෙරෙන බහුකාර්ය ගොඩනැගිල්ල පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ, රැස්වීම් හා සැලසුම් සකස් කිරීමේ කටයුතු ඉටුකිරීම.
2. නාරංවල ශ්‍රී සුමනකීර්ති පිරිවෙනේ ඉදිකෙරෙන බහුකාර්ය ගොඩනැගිල්ල පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ රැස්වීම් හා සැලසුම් සකස් කිරීමේ කටයුතු ඉටුකිරීම.

6.5.9 කළුතර දිස්ත්‍රික්කය

01. හොරණ පොකුණුවිට කිත්සිරි මෙවන් රජමහා විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය.

හොරණ පොකුණුවිට කිත්සිරි මෙවන් රජමහා විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමට යෝජිත නව දෙමහල් සංඝාවාස ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවශ්‍ය මූලික ක්ෂේත්‍ර රාජකාරි සහ ගොඩනැගිලි සැලසුම් හා ඇස්තමේන්තු ලබාදීමට අදාළ රාජකාරි හා අදාළ සම්බන්ධීකරණ රාජකාරි, ගොඩනැගිල්ල ඉදිකිරීමට මුල්ගල තැබීමේ කටයුතුවලට සම්බන්ධ වීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගිවීම.

02. ඔලබොඩුව ගෝනපොල ශ්‍රී ජයවර්ධනාකාර පුරාණ රජමහා විහාර පූජා භූමියෙහි නව සාම්ප්‍රදායික පිරිත් මණ්ඩලය ඉදිකිරීම සඳහා අවශ්‍ය මූලික ක්ෂේත්‍ර රාජකාරි සහ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමට අදාළ සම්බන්ධීකරණ රාජකාරි.
සාම්ප්‍රදායික පිරිත් මණ්ඩපය ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් හා ඇස්තමේන්තු ලබා දීමට අදාල රාජකාරි.
ඔලබොඩුව ගෝනපොල ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ රජමහා විහාර පූජා භූමියෙහි වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර සම්බන්ධ මූලික සාකච්ඡා සඳහා සහභාගී වීම.
ඔලබොඩුව ගෝනපොල ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ රජමහා විහාර පූජා භූමියෙහි (master plan) සකස් කිරීමට අවශ්‍ය මූලික ක්ෂේත්‍ර රාජකාරි සහ සම්බන්ධීකරණ රාජකාරි
03. අලුත්ගම කන්දේ විහාර පුරාණ රජමහා විහාර පූජා භූමිය ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට අදාළ රාජකාරි හා සම්බන්ධීකරණ රාජකාරි.
04. මෙත් සිත් අරණ ව්‍යාපෘතිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ දොඩම්ගොඩ ශ්‍රී සුබෝධිරාජාරාම මහා විහාර පූජා භූමියෙහි ඉදි කිරීමට යෝජිත ධර්ම මණ්ඩලය හා භාවනා කුටි ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් හා ඇස්තමේන්තු ලබාදීමට අදාළ රාජකාරි හා අදාළ සම්බන්ධීකරණ රාජකාරි.

**6.5.10 භූ දර්ශන කටයුතු**

**කතරගම පූජා භූමියේ භූ දර්ශන කටයුතු කිරීම, අලුත්නුවර දැඩි මුණ්ඩ දේවාලයේ භූ දර්ශන කටයුතු කිරීම, ශ්‍රී සමන් දේවාල පූජා භූමියේ භූ දර්ශන කටයුතු කිරීම, ශ්‍රී පලාබද්දල කුඩා නගරයේ භූ දර්ශන කටයුතු කිරීම හා ශ්‍රී සෙනෙවිරත්නාරාමයේ භූ දර්ශන කටයුතු කිරීම**

**6.5.11 ICTA ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ LGN (Lanka Government Network) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**

- ✓ **කාර්යාලය සඳහා අවශ්‍ය නව පරිගණක මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම.**
- ✓ **කාර්යාලීය පරිගණක මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා ගිවිසුම් නඩත්තු කිරීම.**

6.5.12 බිංගිරිය දේවගිරි රජමහා විහාරය සැලසුම් යෝජනා ක්‍රමය

- 2018 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව මෙම විහාරය පූජා භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කිරීම සහ පූජා නගරයක් ලෙස සංවර්ධනය කිරීම.
- පූජා භූමිය සඳහා වින්‍යාස සැලැස්මක් සකස් කිරීම
- පහත සඳහන් ඉදිකිරීම් කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම
    - දේශන ශාලාව (1000 ක පිරිසක් සඳහා)
    - පරිපාලන ගොඩනැගිල්ල (දේශන ශාලාවට අදාළ වේ)
    - කෞතුකාගාරය
    - ආවාස ගෙය හා දාන ශාලාව
    - ඇතුල්වීමේ මණ්ඩපය
    - වැසිකිළි පද්ධතිය
    - නේවාසිකාගාරය (100 ක පිරිසක් සඳහා)
    - පොකුණු ප්‍රතිසංස්කරණය කර ගොඩනැගීම
    - ධාතු මන්දිරය හා පුස්තකාල ගොඩනැගිල්ල

6.5.13 මඩු පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

- මඩු පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම් කටයුතු සිදු කිරීම
- මඩු දේවස්ථාන සඳහා භෞතික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම (ඉටුකළයුතු සංවර්ධන කාර්යයන් ඇතුළත් කරමින්)

6.5.14 සබරගමුව පළාත - පූජා භූමි සංවර්ධන කටයුතු

1.අළුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාල සංවර්දන කටයුතු

- පොලිස් මුරපොළ පුංචි දේවාලය සැලසුම් සකස් කිරීම
- පැති බැම්මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම
- භූ දර්ශන සැලැස්ම සැකසීම
- සියළු සංවර්ධන සැලසුම් සඳහා ඇස්තමේන්තු සැකසීම

2. මැදගොඩ ශ්‍රී සිද්ධ පත්තිනි දේවාලය

- බෝධි ප්‍රාකාර සැලසුම් සකස් කිරීම
- දේවාලයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නව සැලසුම් සකස් කිරීම
- පෙරහැර මාවත සැලසුම් සකස් කිරීම

3. රත්නපුර සමන් මහා දේවාලය

- බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා සැලසුම් සකස් කිරීම
- රථගාල සඳහා සැලසුම් සකස් කිරීම
- මල් කඩ සහ වෙළඳසැල් සඳහා සැලසුම් සකස් කිරීම

4. දැදිගම කොටවෙහෙර

- පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම

5. පූජා භූමි ලෙස නම් කිරීම සඳහා වාර්තා ඉදිරිපත් කර ඇති විහාරස්ථාන

- ශ්‍රී පාදස්ථානය
- කඩිගමුව ශ්‍රී නාගවනරාම රජමහා විහාරය - කෑගල්ල
- ලෙනගල රජමහා විහාරය - වරකාපොල
- මාම්පිට වලගම්බා රජමහා විහාරය

6. ඉන්දියානු භික්ෂු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම

## 7. ඉංජිනේරු අංශයේ කාර්යසාධනය

### 7.1 කාර්යභාරය -

ජාතික සැලසුම, කලාපීය සැලසුම, ප්‍රාදේශීය සැලසුම්, කුඩා නගර, ප්‍රජා නගර, ගොඩනැගිලි, භූ දර්ශන සැලසුම ආදිය සැලසුම් කිරීමේදී හා ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය වන සිවිල් ඉංජිනේරුමය සේවාව කාර්යක්ෂමව ඉටුකර දීම.

### 7.2 කාර්ය මණ්ඩලය -

අධ්‍යක්ෂ ඉංජිනේරු සෘජු අධීක්ෂණය යටතේ ඉංජිනේරු, පරීක්ෂක, ප්‍රමාණ සමීක්ෂණ යන උප අංශ තුනක් මගින් මෙම අංශයේ කාර්යයන් සිදු කෙරේ. අධ්‍යක්ෂ ඉංජිනේරු යටතේ සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු දෙදෙනෙකු, පරීක්ෂකවරු තිදෙනෙකු, ප්‍රමාණ සමීක්ෂක දෙදෙනෙකු, සංවර්ධන නිලධාරියකු, මැනුම් සහායකයන් තිදෙනෙකු හා කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකු සේවයෙහි යෙදී සිටී.

### 7.3 දෛනික රාජකාරි

- ගොඩනැගිලි සඳහා ව්‍යුහ සැලසුම් සකස් කිරීම.
- ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශකත්වය සැපයීම.
- ඇස්තමේන්තු සකස් කිරීම
- ගෙවීම් වාර්තා හා වවුචර්පත් සැකසීම.
- ඉඩම් සමීක්ෂණ සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන ආයතන වෙත රජයේ ඉඩම් අත්පත් කර ගැනීම පැවරීම ආදී කටයුතු සඳහා.
- නගර සැලසුම් සඳහා ඉඩම් පරිහරණ සමීක්ෂණය හා වාර්ථා සැකසීම.
- සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අදාළ වන ලෙසට සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඉදිකිරීම් කාර්යයන් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ, ඉඩම් මැනීම, සිතියම් සකස් කිරීම, සමෝච්ච රේඛා සැලසුම් සකස් කිරීම, නගර සැලසුම් ගොඩනැගිලි සැලසුම් ආදිය භූමියෙහි පිහිටුවීම.
- ඉදිකිරීම් හා භූ දර්ශන කටයුතුවලදී හා නඩත්තු කටයුතුවලදී වැඩබිම් පරිපාලනය
- ඉදිකිරීම් හා භූ දර්ශණ කටයුතුවලදී වැඩ අධීක්ෂණය, බිල්පත් සැකසීම, බිල්පත් සහතිකය, රැඳවුම් මුදල් නිදහස් කිරීමේ වාර්තා, ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි නඩත්තුව සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම.

| | |
|---|---|
| | 2018 වර්ෂයේ සිදුකරන ලද කරනලද කාර්යයන් |
| 01 | අනුරාධපුර පූජා භූමිය - මහා විහාරයේ භූ දර්ශණ කටයුතු. (Inter lock Paving work) |
| 02 | සෙත්සිරිපාය ජාතික භෞතික සැලසුම් ගොඩනැගිල්ල - ජාතික භෞතික සැලසුම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම, විදුලිය ටෙලිෆෝන් සැපයීම, සඳහා ඇස්තමේන්තු සැකසීම, කාර්යාලයීය වායුසමීකරණ පද්ධතිය සඳහා ඇස්තමේන්තු සැකසීම හා සවි කිරීම, work station සහ බිත්ති කබඩ් සඳහා ඇස්තමේන්තු කටයුතු ඇතුළු ඉදිකිරීම් කටයුතු |
| 03 | මහියංගනය - රජමහා විහාරය මායිම් තාප්පය සහ වාහල්කඩ ඉදිකිරීම සඳහා ව්‍යුහ නිර්මාණ සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු සැකසීම. |
| 04 | බොරුල්ල - ගෝතමී විහාරය දාන ශාලාව ආවාස ගෙය බහු කාර්ය ගොඩනැගිල්ල සඳහා දල ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ ව්‍යුහ නිර්මාණ සැලසුම් සකස් කිරීම |
| 05 | පොකුණුවිට - ව්‍යුහ සැලසුම් සහ ඇස්තමේන්තු කටයුතු කර ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරිම. |
| 06 | බිංගිරිය - දේවගිරි රජමහා විහාරය වෙසක් කලාපය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා ව්‍යුහ නිරිමාණ සැලසුම් සකස් කිරීම. |
| 07 | මීවිටිගම්මන - නාලිකේරාරාමය ධර්මශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම් පරීක්ෂා කිරීම සහ බිල් පත් සැකසීම. |
| 08 | මාබිම - තායි ශ්‍රී ලංකා බෞද්ධ මන්දිරය ඉදිකිරිම, අධීක්ෂණය සහ බිල්පත් අනුමත කිරීම. |
| 09 | කෝට්ටේ - රජමහා විහාරය,<br><br>යෝජිත ගොඩනැගිල්ලේ ව්‍යුහ සැලසුම් නිර්මාණ කටයුතු කිරීම. |
| 10 | නාරාහේන්පිට - රාමඤ්ඤනිකාය ප්‍රධාන කාර්යාලය වැඩබිම් පරීක්ෂාව සහ අදාල ඇස්තමේන්තු සැකසීම. |
| 11 | I. දිඹුලාගල රජමහා විහාරය - ආවාස ගොඩනැගිල්ලේ සැලසුම් සඳහා ව්‍යුහ සැලසුම් නිර්මාණ කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීම.<br><br>II.දිඹුලාගල රජමහා විහාර පිරිවෙන් ගොඩනැගිල්ලේ සැලසුම් සඳහා ව්‍යුහ සැලසුම් නිර්මාණ කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීම.<br><br>දිඹුලාගල රජ මහා විහාරයට ඇතුලුවන දොරටුවේ වාහල්කඩ ව්‍යුහ නිර්මාණ සැලසුම් සකස් කිරීම සහ අදාල ඇස්තමේන්තු පිළියෙල කිරීම<br><br>III ආවාස ගොඩනැගිල්ල ඇස්තමේන්තු හා ව්‍යුහ නිරිමාණ සැලසුම් සකස් කිරීම. |

| | |
|---|---|
| 12 | නාරංවල - සුමනකීර්ති පිරිවෙන ධර්මශාලාව සහ දාන ශාලාව ඉදිකිරිම් කටයුතු පරීක්ෂාව සහ බිල්පත් අනුමැතිය. |
| 14 | මොරටුව - සොයිසාරාමය, යෝජිත ගොඩනැගිල්ල සඳහා ව්‍යුහ සැලසුම් පිලියෙළ කිරිම සහ ඇස්තමේන්තු සැකසීම. |
| 15 | කතරගම- සංචාරක බංගලා අළුත්වැඩියා කටයුතු සදහා ඇස්තමේන්තු සැකසීම සහ ටෙන්ඩර් කටයුතු ඇතුළු වැඩ පරීක්ෂාව. |
| 16 | වැල්ලම්පිටිය - සිහිලැල් දැහැන භූ දර්ශන කටයුතු හා ඊට අදාළ ඇස්තමේන්තු සකස් කිරිම. |
| 17 | මාතර -මහින්ද මහා විහාරය පිරිවෙන් වැසිකිලි පද්ධතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |
| 18- | ශ්‍රී දළදා මාලිගය - ව්‍යාපෘති කාර්යාලය සඳහා අදාළ ඇස්තමේන්තු සකස් කිරිම |
| 19 | අළුත්නුවර දේවාලයේ - භූ දර්ශන කටයුතු හා ඇස්තමේන්තු සකස් කිරිම |
| 20 | ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධ විහාරයේ ධර්ම මණ්ඩප ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සහ බිල්පත් අනුමැතිය. |

# 08.වාස්තු විද්‍යා අංශය

## 08.1 කාර්යභාරය

වාස්තු විද්‍යා අංශය ක්‍රියාත්මක වන්නේ අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) මගිනි. අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) මගින් භාර දෙන ලද ව්‍යාපෘතීන් සඳහා වන වාස්තු විද්‍යාත්මක නිර්මාණ කටයුතු සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) හා භෞතික සැලසුම් සහකාර (වාස්තු විද්‍යා) මගින් හා ඉංජිනේරු අංශය මගින් ලබා දෙන ව්‍යුහ නිර්මාණ ප්‍රාදේශීය සැලසුම් හා කලාපීය සැලසුම් අංශ මගින් නිර්මාණය කර ලබා දෙන වින්‍යාස සැලසුම්, වාස්තු විද්‍යා අංශයේ සැලසුම් කාර්යාල සහකාර මගින් සැලසුම් ශිල්පීන් වෙත ලබා දී පරිගණකානුසාරයෙන් දල සැලසුම් අන්දවා ගැනීම හා වැඩබිම් අධීක්ෂණය හා කළමනාකරණය, සැලසුම් මුද්‍රණය කර පවත්වාගෙන යාම, සැලසුම් සකස් කිරීම, පවත්වාගෙන යාම මෙම අංශයේ කාර්යභාරය වේ. එසේම සකස් කරනු ලබන දල සැලසුම් ගබඩා කිරීම, පිටපත් කිරීම, නඩත්තු කිරීම හා විනාශ නොවී පවත්වාගෙන යාමද සිදු කරයි.

- I. දෙපාර්තමේන්තුවට සෘජුවම රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන ව්‍යාපෘති හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් හා බුද්ධ ශාසන අමාත්‍යාංශය මගින් ලබා දෙන ඉදිකිරීම් ව්‍යාපෘතිවල වාස්තු විද්‍යා නිර්මාණ/යෝජනා සකස් කර සේවා දායකයින්ට හා අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම
- II. වාස්තු විද්‍යා නිර්මාණ, ව්‍යුහ ඉංජිනේරු නිර්මාණ හා නාගරික වින්‍යාස සැලසුම් දල සැලසුම් ගත කිරීම
- III. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ හා මනා සම්බන්ධීකරණය කිරීම.
- IV. වාස්තු විද්‍යා නිර්මාණ කරන ලද සැලසුම් සඳහා අදාළ ආයතන වෙතින් අනුමැතිය ලබා ගැනීම
- V. වැඩබිම් ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩබිම් සාකච්ඡා, සම්මන්ත්‍රණ පැවැත්වීම සහභාගි වීම හා ඉදිකිරීම් අධීක්ෂණය හා ප්‍රමිතිය හා නඩත්තු පිළිබඳ නියාමනය කිරීම.
- VI. තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සම්බන්ධ වෙමින් ඒ සඳහා කටයුතු කිරීම.
- VII. ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම හා ඒ හා සහාය වීම.

## 08.2 කාර්ය මණ්ඩලය

මෙම කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) මගින් කළමනාකරණය හා අධීක්ෂණය සිදු කරයි. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හා සහකාර අධ්‍යක්ෂවරු 02 ක්, භෞතික සැලසුම් සහකාර (වාස්තු විද්‍යා) 01, සැලසුම් කාර්යාල සහකාරවරුන් 03 දෙනෙක් හා සැලසුම් ශිල්පීන් 21 දෙනෙකුගෙන් සමන්විත වේ. එක් සැලසුම් කාර්යාල සහකාරවරයකු හා සැලසුම් ශිල්පීන් කිහිප දෙනෙකු සේවා අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ (ඉංජිනේරු) යටතේ ප්‍රමාණ සමීක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත.

සකස් කරන සැලසුම්පත් ගබඩා කිරීම, නිකුත් කිරීම, පිටපත් කිරීම, අළුත්වැඩියා කිරීම හා විනාශ නොවී පවත්වාගෙන යාම සඳහා සැලසුම් භාර සහකරුවකු, සැලසුම් මුද්‍රණ ශිල්පීන් දෙදෙනෙකු, සැලසුම් අළුත්වැඩියා කරන්නකු හා කාර්යාල කාර්ය සහායකයකු මෙම අංශය යටතේ තවදුරටත් සේවයේ නියුක්ත වේ.

## 8.3 2018 වසරේදී සකස් කරන ලද සැලසුම්

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | සැලසුම් අංකය |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරය, හෝමාගම,ධම්ම මණ්ඩපය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/01 |
| | ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරය, හෝමාගම - භාවනා කුටිය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/01 |
| | ශ්‍රී ලංකා බෞද්ධ මන්දිරය - මොරටුව | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/02 |
| | නවගමුව පත්තිනි දේවාලය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/05 |
| | බොරැල්ල ගෝතමී විහාරය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/06 |
| | මුණ්ඩිගල ආරණ්‍ය සේනාසනය, අවිස්සාවේල්ල (කාන්තා නේවාසිකාගාරය හා පුස්තකාලය) | NPPD/ARCHI2016/බස්නාහිර/කොළඹ/09 |
| | කෝට්ටේ රජමහා විහාරය බහුකාර්ය ගොඩනැගිල්ල 1 | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/11 |
| | ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/12 |
| | සර්වෝදය විපස්සනා භාවනා මධ්‍යස්ථානය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/13 |
| | කොටහැර ශ්‍රී රාජගල විහාරය | NPPD/ARCHI/2016/බස්නාහිර/කොළඹ/14 |
| ගම්පහ දිස්ත්‍රික්කය | අත්තනගල්ල මීටිවිගම්මන නාලිකේරාරාමය විහාරය දාන ශාලාව හා රැස්වීම් ශාලාව | NPPD/ARCHI/2016/බස්නාහිර/ගම්පහ/01 |
| | අත්තනගල්ල එලලක්කල පුරාණ රජමහා පත්තිනි දේවාලය | NPPD/ARCHI/2016/බස්නාහිර/ගම්පහ/02 |
| | මාබිම සීවලී විහාරය භාවනා කුටිය, සීවලී විහාරය ධම්ම මණ්ඩපය | NPPD/ARCHI/2016/බස්නාහිර/ගම්පහ/05 |
| | මහර නාරංවල ශ්‍රී සුමනකීර්ති මහ පිරිවෙන දාන ශාලාව හා රැස්වීම් ශාලාව | NPPD/ARCHI/2016/බස්නාහිර/ගම්පහ/06 |
| | බුදු මැදුර වැඩි දියුණු කිරීම | NPPD/ARCHI/2016/බස්නාහිර/ගම්පහ/06 |
| කළුතර දිස්ත්‍රික්කය | කිත්සිරිමෙවන් රජමහා විහාරය පොකුණුවිට, සංඝාවාසය, භාවනා කුටිය | NPPD/ARCHI/2016/බස්නාහිර/කළුතර/02 |
| | හොරණ, ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම විහාරය | NPPD/ARCHI/2016/බස්නාහිර/කළුතර/03 |
| නුවර දිස්ත්‍රික්කය | අස්ගිරිය මහානායක හිමිගේ නිල නිවාසයේ ප්‍රවේශ මාර්ගය සැකසීම | NPPD/ARCHI/2017/මධ්‍යම/නුවර/03-02 |
| | අස්ගිරිය මහා විහාරයේ ලේකම් කාර්යාලයේ ගබඩා සංකීර්ණය | NPPD/ARCHI/2017/මධ්‍යම/නුවර/03-03 |
| | දහම් පාසල් ගොඩනැගිල්ල | NPPD/ARCHI/2017/මධ්‍යම/නුවර/03-4 |
| | පෙරහැර ප්‍රවේශ මාර්ගයේ දෙපස වීදි සැලැස්ම | NPPD/ARCHI/2017/මධ්‍යම/නුවර/03-4 |
| | භෞතික සැලසුම් කාර්යාලය දළදා මාලිගාව අසල | NPPD/ARCHI2017/මධ්‍යම/නුවර/4 |
| මාතලේ දිස්ත්‍රික්කය | මාතලේ අළුවිහාර පූජා භූමිය යෝජිත බහුකාර්ය ගොඩනැගිල්ල | NPPD/ARCHI/2017/මධ්‍යම/මාතලේ/1 |
| | රංගිරි දඹුල්ල රජමහා විහාරයේ පෞරාණික ප්‍රවේශ මාර්ගය වාහල්කඩ | NPPD/ARCHI/2017/මධ්‍යම/මාතලේ/2 |
| | මාතලේ අළුවිහාරය සමරු ඵලකය | NPPD/AR/02/01-01/2018/43 |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | ශ්‍රී සුමනාරාමය - මාගස්තොට බහු කාර්ය ගොඩනැගිල්ල | NPPD/AR/02/03-01/2018/01 |
| ගාල්ල දිස්ත්‍රික්කය | තොටගමුව රත්පත් රජමහා විහාරය - 2019 රාජ්‍ය වෙසක් උත්සවය | NPPD/AR/03/01-01/2018/40 |
| මාතර දිස්ත්‍රික්කය | ගැටබරුව රජමහා විහාරය කොටපොල මාතර | NPPD/ARCHI2016/දකුණ/මාතර/01 |
| | මන්තින්ද මහා පිරිවෙන | NPPD/ARCHI/දකුණ/මාතර/2018/01 |
| | දෙවිනුවර පූජා භූමිය | NPPD/AR/03/02-02/2018/32 |
| හම්බන්තොට | තිස්සමහාරාම සඳගිරි මහා විහාරය | NPPD/ARCHIදකුණ/හම්බන්තොට/01 |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | කතරගම ශ්‍රී අභිනවාරාම මහා විහාරය | NPPD/ARCHI/දකුණ/හම්බන්තොට/03 |
| | තකරගම පූජා භූමිය | NPPD/ARCHI/දකුණ/හම්බන්තොට/04 |
| | කතරගම පොලිස් මුරපොළ | NPPD/ARCHI/දකුණ/හම්බන්තොට/2018/02 |
| | කතරගම මුස්ලිම් දේවස්ථානය | NPPD/ARCHI/දකුණ/හම්බන්ටතාට/2018/03 |
| | කතරගම පූජාභූමියේ ගණ දේවාලයේ මුළුතැන් කාමරයක් ඉදිකිරීම | NPPD/AR/03/03-04/2018/30 |
| | ඇත්ගොව්වන් සඳහා නව නිවාස හා අලි ඇතුන් සඳහා නවාතැන්පළක් ඉදිකිරීම | NPPD/AR/03/03-05/2018/31 |
| | කිරි ඉතිරවීමේ කාර්යය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | NPPD/AR/03/03-07/2018/46 |
| | මහසෙන් සේනාසනය කතරගම | NPPD/AR/03/03-08/2018/47 |
| | නව සණ්ඨාර කුළුණක් ඉදිකිරීම | NPPD/AR/03/03-09/2018/48 |
| | ඊශ්වර දේවාලය කතරගම | NPPD/ARCHI/දකුණ/හම්බන්තොට |
| අම්පාර දිස්ත්‍රික්කය | අම්පාර විද්‍යානන්ද මහ පිරිවෙන | NPPD/ARCHI/2016/නැගෙනහිර/අම්පාර/01 |
| | අරන්තලාව බෞද්ධ මධ්‍යස්ථානය ආවාසය | NPPD/ARCHI2016/නැගෙනහිර/අම්පාර/02 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | පුළුකුණාව රජමහා විහාරය - ආවාසය | NPPD/ARCHI2016/නැගෙනහිර/මඩකලපුව/01 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | සේරුවිල මංගල රජමහා විහාරය - සනීපාරක්ෂක ගොඩනැගිල්ල | NPPD/ARCHI2016/නැගෙනහිර/ත්‍රිකුණාමලය/01-1 |
| | සේරුවිල පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | NPPD/ARCHI2016/නැගෙනහිර/ත්‍රිකුණාමලය/01-11 |
| | සේරුවිල විශ්‍රාම ශාලාව - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | NPPD/ARCHI2016/නැගෙනහිර/ත්‍රිකුණාමලය/01-111 |
| | ධර්ම ශාලාව | NPPD/ARCHI2016/නැගෙනහිර/ත්‍රිකුණාමලය/01-iv |
| | තිරියාය ගිරිහඩුසෑය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | NPPD/AR/05/01-01/2018/02 |
| | සිරිමාපුර අනන්දාරාමය | NPPD/ARCHI/නැහෙනහිර/ත්‍රිකුණාමලය/01 |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | ශ්‍රී ශාසනාලංකාර මහා විහාර භූදර්ශන සැලැස්ම | NPPD/ARCHI/2016/වයඹ/කුරුණෑගල/01 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 2018 ජාතික වෙසක් උත්සවය නිමිත්තෙක් සිදුකරන බිංගිරිය දේවගිරි පූජාභූමි ව්‍යාපෘතිය ධර්ම ශාලාව, කෞතුකාගාරාය, සනීපාරක්ෂක ගොඩනැගිල්ල, කාර්යාල ගොඩනැගිල්ල, නේවාසිකාගාරය හා කෑම කාමරය, සනීපාරක්ෂක ගොඩනැගිල්ල, | NPPD/ARCHI/2016/වයඹ/පුත්තලම/01 |
| | තලවිල ශාන්ත ආනා දේවස්ථානය | NPPD/ARCHI/2016/වයඹ/පුත්තලම/02 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | අනුරාධපුර පූජා නගරය සනීපාරක්ෂක ගොඩනැගිල්ල (රුවන්වැලි සෑය) | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-1 |
| | අනුරාධපුර පූජා නගරය සනීපාරක්ෂක ගොඩනැගිල්ල (ඉසුරුමුණිය) | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-11 |
| | අනුරාධපුර පූජා නගරය සනීපාරක්ෂක ගොඩනැගිල්ල (සමාධි පිළිමය) | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-111 |

| | | |
|---|---|---|
| | අනුරාධපුර මහා විහාරයේ භූ දර්ශන ව්‍යාපෘතිය | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-iv |
| | අනුරාධපුරය සංචාරක නිල නිවාස භූමියේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තු කාර්යාලය ඉදිකිරීම | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-v |
| | අනුරාධපුර සීමාමාලකය හා ලෝවාමහාපාය | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/01-vi |
| | ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය | NPPD/ARCHI/2016/උතුරුමැද/අනුරාධපුර/03 |
| | අභය වැව උද්‍යානය සංවර්ධනය කිරිම | NPPD/AR/07/01-02/2018/42 |
| | අනුරාධපුර කොරකහවැව භාවනා කුටි ඉදිකිරිම | NPPD/AR/07/01-05/2018/41 |
| පොලොන්නරුව දිස්ත්‍රික්කය | දිඹුලාගල රජමහා විහාරය පිරිවෙන හා ආවාසය | NPPD/ARCHI/2016/උතුරුමැද/පොලොන්නරුව /03 |
| | දිඹුලාගල වාහල්කඩ | NPPD/ARCHI/2016/උතුරුමැද/පොලොන්නරුව /03 |
| | දිඹුලාගල භාවනා කුටිය | NPPD/ARCHI/2016/උතුරුමැද/පොලොන්නරුව /03 |
| | සෝමාවතී පූජා භූමියට සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය | NPPD/ARCHI/2016/උතුරුමැද/පොලොන්නරුව /04 |
| | පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය අසල සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /05 |
| | පිබිදෙන පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘති | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /16 |
| | පොළොන්නරුව පාසල් 8 (Master Plan) | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07 |
| | 1.කදුරුවෙල මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය, තමන්කඩුව | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-i |
| | 2.විජිත මධ්‍ය මහා විද්‍යාලය, ලංකාපුර | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-ii |
| | 3.විලයයා මධ්‍ය මහා විද්‍යාලය, අරලගංවිල | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-iii |
| | 4.මනම්පිටිය දෙමළ මහා විද්‍යාලය, දිඹුලාගල | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-iv |
| | 5.වැලිකන්ද මහා විද්‍යාලය, වැලිකන්ද | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-v |
| | 6.මැදිරිගිරිය ජාතික පාසල, මැදිරිගිරිය | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-vi |
| | 7.මින්නේරිය ජාතික පාසල, හිඟුරක්ගොඩ | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-vii |
| | 8.මහසෙන් මධ්‍ය මහා විද්‍යාලය, ඇලහැර | NPPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /07-viii |
| | පොළොන්නරුව පොත්ගුල් විහාරය, කුඩා වෙළඳ කුටි | PPD/ARCHI/ උතුරුමැද/පොලොන්නරුව /05 |
| පොලොන්නරුව දිස්ත්‍රික්කය | ටැම්පිට රජමහා විහාරය හබරණ | NPPD/AR/07/02-06/2018/37 |
| | පොළොන්නරුව ධවල මන්දිර රංග ශාලාව | |
| බදුල්ල දිස්ත්‍රික්කය | ඌව වෙල්ලස්ස සත්පත්තිනි දේවාලය - ඊතණවත්ත | NPPD/ARCHI2016/ඌව/බදුල්ල/01 |
| | ඓතිහාසික මහියංගන රජමහා විහාරය | NPPD/ARCHI2016/ඌව/බදුල්ල/02 |
| මොණරාගල දිස්ත්‍රික්කය | V2025 Enterprises Exhibition | NPPD/AR/08/02-02/2018/23 |
| | මාලිගාවිල විහාරය - ධර්ම ශාලාව, දහම් පාසල් ගොඩනැගිල්ල | NPPD/ARCHI2016/ඌව/මොණරාගල/03 |

| | | |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය | වට්ටාරම රජමහා විහාරය ධර්ම ශාලාව | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/01 |
| | වට්ටාරම ප්‍රධාන පිවිසුම් මාර්ගය හා උද්‍යාන අලංකරණය | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/01-i |
| | වට්ටාරම යෝජිත රථගාල | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/01-ii |
| | දැදිගම කොටවෙහෙර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/02 |
| | කෑගල්ල මැදගොඩ සිද්ධපත්තිනි දේවාලය | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/03 |
| | අළුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලය | NPPD/ARCHI2016/සබරගමුව/කෑගල්ල/04 |
| රත්නපුර දිස්ත්‍රික්කය | රත්නපුර සමන් මහා දේවාලය | NPPD/ARCHI2016/සබරගමුව/රත්නපුර/01 |
| | සූරියකන්ද භාවනා මධ්‍යස්ථානය | NPPD/ARCHI2016/සබරගමුව/රත්නපුර/03 |

**මීට අමතරව තාක්ෂණික ඇගයීම් කමිටු හා ටෙන්ඩර් මණ්ඩල කටයුතු සඳහා සහභාගිවීම, අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතුවලදී වාස්තු විද්‍යා නිරීක්ෂණ katayuthu ha උපදේශනයෙන් දායක වී ඇත.**

# 09.ගිණුම් අංශයේ කාර්යසාධනය

## 09.1 ගිණුම් අංශයේ අරමුණු

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ, මූල්‍ය රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අනෙකුත් චක්‍රලේඛ නීතිරීතිවලට පටහැනි නොවන සේ ඵලදායීව හා කාර්යක්ෂමව මූල්‍ය කළමනාකරණය සිදු කිරීම.

## 09.2 සේවාවන්

1. දෙපාර්තමේන්තුවේ හා ව්‍යාපෘතිවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන, අනෙකුත් අදාල දීමනා ගෙවීම.
2. සැපයුම් වැඩ හා සේවා ලබාගැනීම සඳහා  නියමිත පරිදි ගෙවීම් කිරීම
3. සිදු කරනු ලබන මූල්‍යමය ගණුදෙනුවලට අදාල මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
4. වාර්ෂික ගිණුම් හා පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
5. මාසික වියදම් වාර්තා පිළියෙළ කර අදාල පාර්ශ්වන් වෙත ඉදිරිපත් කිරීම
6. දෙපාර්තමේන්තුවට හා ඒ යටතේ ඇති ආයතන වලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම හා ගබඩා පාලනය.
7. වත්කම් ගිණුම් ගත කිරීමේ කටයුතු
8. විගණකාධිපති වෙත විගණනය සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කිරීම හා විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කිරීම.
9. අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ගෙවීම හා අයකර ගැනීම.

## 09.3 කාර්ය මණ්ඩලය

ප්‍රධාන ගණකාධිකාරීගේ  සෘජු අධීක්ෂණය යටතේ, කළමනාකරණ සහකාරවරු දසදෙනෙක්, සංවර්ධන නිලධාරිනියක්  සහ කාර්යාල කාර්ය සහායකවරු දෙදෙනෙකුගෙන්  යුතු කාර්ය මණ්ඩලයකින් ඉහත කාර්යයන් සිදු කරන ලදී.

2018 වර්ෂයට අදාල ගිණුම් අංශයේ නිලධාරීන් සංඛ්‍යාව

| | තත්‍ය අගය |
|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 10 |
| කාර්යාල කාර්ය සහායක | 02 |

## 2018 වර්ෂයේ ගිණුම් අංශයෙන්  සිදු කරන ලද කාර්යයන්  හා මූල්‍ය ප්‍රගතිය

- දෙපාර්තමේන්තුවේ හා ව්‍යාපෘතිවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන, අනෙකුත් අදාළ දීමනා ගෙවීම් සකස් කර  චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් කර ඇත.
- සිදු කරනු ලබන මූල්‍යමය ගණුදෙනු වලට අදාළ මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.

- සැපයුම් වැඩ හා සේවා ලබාගැනීම වෙනුවෙන් වර්ෂයට අදාල ගෙවිය හැකි සියළු ගෙවීම් අවසන් කර ඇත.
- වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම. විසර්ජන ගිණුම පිළියෙල කර මාර්තු 31 දිනට පෙර ඉදිරපත් කර ඇත. අත්තිකාරම් බී ගිණුම මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රේල් 30 දිනට පෙර ඉදිරිපත් කර ඇත.
- දෙපාර්තමේන්තුවට හා ඒ යටතේ ඇති ආයතනවලට අවශ්‍ය භාණ්ඩ නිසිපරිදි මිලදී ගැනීම, මිලදී ගැනීම හා ගබඩා කටයුතු පවත්වා ගෙන යාම.
- ප්‍රධාන කාර්යාලයේ හා සංචාරක බංගලා, ව්‍යපෘති කාර්යාලයන්හි ස්ථාවර වත්කම් (ඉඩම් හා ගොඩනැගිලි හැර)ගණනය කිරිමේ කටයුතු අවසන්කර ගිණුම් ගතකර ඇත.
- ප්‍රධාන කාර්යාලයේ හා සංචාරක බංගලා, ව්‍යපෘති කාර්යාලයන්හි භාණ්ඩ සමීක්ෂණ හා අදාල භාණ්ඩ අපහරණ කටයුතු නියමිත පරිදි අවසන් කර ඇත.
- විගණකාධිපති වෙත විගණනය සඳහා ලිපි ලේඛණ ඉදිරිපත් කිරීම. විගණන විමසුම්වලට පිළිතුරු යැවීම නියමිත දිනට සම්පූර්ණ කර ඇත.
- අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ගෙවීම හා අය කර ගැනීම නියමිත පරිදි අදාල සීමාවන් තුල සම්පූර්ණ කර ඇත.

මූල්‍ය කාර්ය සාධනය

**1. පුද්ගලික පඩිනඩි හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2018**

| | 2018 ඇස්තමේන්තු (රු) | මු.රෙ.66/69 මාරු කිරීම් (රු) | පරිපූරක ඇස්තමේන්තු (රු) | මුළු ප්‍රතිපාදන (රු.) | මුළු වියදම (රු) |
|---|---|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 150,000,000 | -1,670,933 | | 148,329,067 | 131,821,788 |

**2 .අනෙකුත් පුනරාවර්තන වියදම් හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2018**

| | 2018 ඇස්තමේන්තු (රු) | මු.රෙ.66/69 මාරු කිරීම් (රු) | පරිපූරක ඇස්තමේන්තු (රු) | මුළු ප්‍රතිපාදන (රු.) | මුළු වියදම (රු) |
|---|---|---|---|---|---|
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 48,360,000 | 1,670,933 | - | 50,030,933 | 49,888,376 |

**3 . 2018 වර්ෂයේ ආදායම් වාර්තාව**

| විස්තරය | මූලික ඇස්තමේන්තුව (රු.මි) | සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | ආදායම 2018 (රු.මි) |
|---|---|---|---|
| 2002-01-01 | 2.0 | - | 1.7 |
| 2002-02-99 | 1.0 | - | 1.4 |
| 2003-99-00 | 0.5 | - | 3.4 |

**4 . එක් එක් ප්‍රාග්ධන වැය විෂයන් හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2018**

| වැය ශීර්ෂය | 2018 ඇස්තමේන්තු | මු.රෙ. 66/69 මාරු කිරීම් (රු) | පරිපූරක ඇස්තමේන්තු | මුළු ප්‍රතිපාදන | මුළු වියදම |
|---|---|---|---|---|---|
| 311-1-1-0-2001 | 1,000,000 | 8,990,000 | - | 9,990,000 | 7,851,716 |
| 311-1-1-0-2002 | 200,000 | - | - | 200,000 | 100,894 |
| 311-1-1-0-2003 | 1,000,000 | - | - | 1,000,000 | 942,286 |
| 311-1-1-0-2102 | 1,000,000 | 15,000,000 | - | 16,000,000 | 13,991,682 |
| 311-1-1-0-2103 | 5,000,000 | - | - | 5,000,000 | 4,982,237 |
| 311-1-1-0-2401 | 500,000 | - | - | 500,000 | 478,000 |
| 311-1-1-0-2506 | 5,000,000 | | - | 5,000,000 | 359,850 |
| 311-1-2-0-2506 | 185,000,000 | -23,990,000 | - | 161,010,000 | - |

## 5 . රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සීමාවන් හා සත්‍ය අගයන් - 2018

ගිණුම් අංකය - 311011

| | සීමාව | සත්‍ය අගය |
|---|---|---|
| උපරිම හර සීමාව | 15,000,000 | 14,569,041 |
| අවම බැර සීමාව | 8,500,000 | 10,245,425 |
| උපරිම හර ශේෂ සීමාව | 50,000,000 | 38,966,817 |

## 10.අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී | 02 |

### 10.1 අරමුණු

දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමය සම්බන්ධයෙන් සොයා බලා එම කටයුතුවලින් වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම.

### 10.2 අභ්‍යන්තර විගණන කාර්යයන්

- ✓ වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන් තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.
- ✓ ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වාසනීය භාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.
- ✓ කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටු කිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම.
- ✓ දෙපාර්තමේන්තුවේ වත්කම්, සියළුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.
- ✓ රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කර ඇති පරිපූරක උපදෙස් ද පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.
- ✓ නාස්තිය,නිස්කාර්ය ධාරිතාව සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරාලනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.
- ✓ දෙපාර්තමේන්තුවේ ගිණුම් පරිපාටිය සහ කිසියම් මුදල් වැයවීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දෙපාර්තමේන්තුවේ දේපළ හා වත්කම ආරක්ෂාකාරි ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම.

**10.3 2018 වර්ෂය තුළ සිදු කළ කාර්යයන්**

- 2018 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා ක්ෂේත්‍ර සම්බන්ධව සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් තුළින් අනාවරණය කර ගත් කරුණු සම්බන්ධව විගණන නිරීක්ෂණ වාර්තා 15 ක් ඉදිරිපත් කර ඇත.
- 2018 වර්ෂය තුළ පැවැත් වියයුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතර (04) පවත්වා ඇත.
- විගණකාධිපති විසින් 2018 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සහ විගණන වාර්තා 04 කට අදාළ පිළිතුරු සැපයුම සම්බන්ධිකරණය කිරීම.